# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 16 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 04/01/2024 පැය 1310

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධි ලෙස මෙරටට රැගෙන එන ලද විදේශිය දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන් තොටුපල ඒකකය.**

2024.01.04 වන දින උදෑසන කාලයේ ගුවන් තොටුපල මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ද තොරතුරක් අනුව වැටලීමක් සිදු කර මස්කට් සිට ගුවන් යානයකින් මෙරටට පැමිණෙන ලද ගුවන් මගියෙකු සන්තකයේ තිබී නීති විරෝධීව මෙරටට රැගෙන ලද විදේශීය රටක නිෂ්පාදිත සිගරට් 27120 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස 47 ක් වූ කොටගෙදර, පිලියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන් තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව ඖෂධ ගබඩා කරගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුරය පොලිස් ස්ථානය**

2024.01.03 වන දින රාත්‍රි කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව සාලිය මාවත, අනුරාධපුර ප්‍රදේශයේ වැටලීමක් සිදු කර ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව සහ ජාතික ඖෂධ නියාමක අධිකාරියේ නිසි බලපත්‍රයක් නොමැතිව **විවිධ වර්ගයේ ඖෂධ වර්ග 187,600ක්, සිරප් හා පැණි බෝතල් 173 ක් හා ක්‍රීම් අඩංගු ටියුබ් 20 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ සාලිය මාවත, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 03. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2024.01.03 වන දින උදෑසන කාලයේදී ඇතිමලේ පොලිස් වසමේ උඩික්කැපුආර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත **අක්කර ½ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා හේනක්** වටලා සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 71 ක් වූ උඩික්කැපුආර, විලඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 04. රිය අනතුරකින් පොලිස් නිලධාරියෙකු මියයාමක් - පැලියගොඩ පොලිස් වසම.

2024.01.03 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ පැලියගොඩ ප්‍රදේශයේදී කොළඹ සිට මහනුවර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ මැද දූපතේ ගැටී විදුලි පහන්කණුවකද හැපී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ කොල්ලුපිටිය ප්‍රදේශයේ පදිංචි කොල්ලුපිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කල උප පොලිස් පරීක්ෂක වරයෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මෝදර පොලිස් වසම.

2024.01.03 වන දින සවස් කාලයේ මෝදර පොලිස් වසමේ අළුත් මාවත ඔස්සේ මට්ටක්කුලිය දෙසට ධාවනය කල ලොරි රථයක් මාර්ගය ගමන්ගත් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරකින් කාන්තාවන් දෙදෙනෙකු මියයාම - දක්ෂිණ අධිවේගී මාර්ගය කුරුඳුගහහැතැක්ම

2024.01.03 වන දින රාත්‍රි කාලයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ 72.7 එල් ස්ථානයේදී කොළඹ දෙස සිට මත්තල දෙසට ධාවනයවූ වෑන් රථයක් එම දිශාවටම ධාවනයවූ ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ රියදුරු ඇතුළු 06 දෙනෙකු තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කර ඇති අතර ඉන් ප්‍රතිකාර ලබමින් සිටියදි කාන්තාවන් දෙදෙනෙකු මියගොස් ඇත.

**මරණකාරියන් අවුරුදු 57 හා 32 වයස් වල පසුවන බැරගම, අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචි මව සහ දියණිය වේ.**

මෘත ශරීර කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් දක්ෂිණ අධිවේගී මාර්ගය කුරුඳුගහහැතැක්ම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.